## විසර්ජන ශීර්ෂය 279 කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
## විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) ව්‍යවස්ථාපිත අණ පනත් මඟින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.

(ආ) රජයේ ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් හා සංවර්ධන ව්‍යාපෘති (සමෘද්ධි හා විමධ්‍යගත වැඩ සටහන්) රජයේ නියමයන්, උපදෙස් හා මඟ පෙන්වීම් වලට අනුකූලවන පරිදි ක්‍රියාවට නැංවීම, සහතික කිරිම.

(ඇ) දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් ජනතා අභිවෘද්ධිය සඳහා ඉටු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා පරිපාලන කටයුතු යථාවත් පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සමායෝජනය, සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ඈ) ආණ්ඩුවේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරිම.

(ඉ) ස්වභාවික ව්‍යවසන හා වෙනත් ආපදා දිස්ත්‍රික්කය තුල ඇති වූ අවස්ථා වලදී ප්‍රායෝගිකව මැදිහත් වී කටයුතු කිරිම.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) කෑගල්ල
(ආ) මාවනැල්ල
(ඇ) අරණායක
(ඈ) බුලත්කොහුපිටිය
(ඉ) රඹුක්කන
(ඊ) ගලිගමුව
(උ) වරකාපොල
(ඌ) දෙහිඕවිට
(එ) රුවන්වැල්ල
(ඒ) යටියන්තොට
(ඔ) දැරණියගල

1.3 විගණන විෂය පථය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) විසර්ජන ගිණුම

(I) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.628,772,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.602,494,316 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.26,277,684 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.18 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 350,525,000 | 581,522,000 | 15,330,478 | 2.64 |
| මූලධන | 47,250,000 | 47,250,000 | 10,947,206 | 23.17 |
| එකතුව | 397,775,000 | 628,772,000 | 26,277,684 | 4.18 |

(II) ප්‍රතිපාදන ඌන උපයෝජන

වැය විෂයයන් 06 කට එකතුව රු.1,551,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එයින් එකතුව රු.371,381 ක් උපයෝජනය කිරීමෙන් පසු ප්‍රතිපාදනයෙන් රු.1,179,619 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරියන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට100 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

(III) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.3,682,058,726 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබාදී තිබුණු අතර, ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 534,700 | 523,580 | 11,120 |
| 102 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 108,000 | 76,462 | 31,538 |
| 103 | රාජ්‍ය ආරක්ෂක නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 373,853 | 342,577 | 31,276 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2,206,036,568 | 1,915,359,904 | 290,676,664 |
| 106 | ආපදා හා කළමනාකරණ අමාත්‍යාංශය | 3,056,499 | 1,374,733 | 1,681,766 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,479,703 | 2,338,948 | 140,755 |
| 117 | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 140,000 | 130,975 | 9,025 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 2,467,000 | 1,502,882 | 964,118 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 13,291,483 | 11,392,104 | 1,899,379 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 10,357,183 | 10,172,714 | 184,469 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 15,505,631 | 15,070,422 | 435,209 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 6,344,534 | 5,750,407 | 594,127 |
| 134 | ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 171,000 | 163,384 | 7,616 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 4,749,112 | 4,671,947 | 77,165 |
| 156 | යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 1,562,700 | 1,392,018 | 170,682 |

| | | | | |
|---|---|---|---|---|
| 160 | පරිසර අමාත්‍යාංශය | 25,000 | 25,000 | - |
| 173 | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 667,850 | 579,500 | 88,350 |
| 177 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 1,358,424 | 1,349,253 | 9,171 |
| 179 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 90,000 | 67,765 | 22,235 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 10,132,667 | 9,366,956 | 765,711 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 298,000 | 290,295 | 7,705 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 8,000 | - |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 8,086,321 | 6,659,077 | 1,427,244 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 6,925,210 | 6,635,471 | 289,739 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 698,178,865 | 550,167,059 | 148,011,806 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,434,245 | 1,234,728 | 199,517 |
| 226 | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | 4,575 | 3,255 | 1,320 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 23,149,069 | 22,196,918 | 952,151 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 654,363,000 | 645,139,524 | 9,223,476 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 224,777 | 224,046 | 731 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 655,267 | 591,919 | 63,348 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 1,496,854 | 1,406,956 | 89,898 |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 6,693,907 | 5,898,512 | 795,395 |
| 328 | මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව | 1,088,729 | 1,027,728 | 61,001 |
| | | 3,682,058,726 | 3,223,135,019 | 458,923,707 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිල ගණන් කැඳවීමකින් හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා නොමැතිව, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු තීරණ පදනම් කරගෙන රු.3,306,250 ක් වටිනා "ඩෙල්" වර්ගයේ මේසය මත තබන පරිගණක 38 ක් සහ “ප්‍රෝලින්ක්'' වර්ගයේ අඛණ්ඩව විදුලිය සපයන යන්ත්‍ර 35 ක් වැය විෂය අංක 121 – 1 – 4 – 4 – 0 – 2103 – 2 හරකර මිලදීගෙන තිබුණි.

(ii) මාර්ග කාපට් කිරීමට රාජ්‍ය සංවර්ධන නිර්මාණ නීතිගත සංස්ථාවට 2012 ජුලි 23 දින ලබාදී තිබූ රු.76,432,929 ක් වටිනා අත්තිකාරම් 2012 දෙසැම්බර් 31 පියවීමට අදාල බිල්පත් ඉදිරිපත් කර නොතිබියදී එම මුදල වියදමක් වශයෙන් 105-2-3-17-2502-1 වැය විෂයට හරකර තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කිරීමකින් තොරව හා මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාර භාණ්ඩ ලැබුණු බවට ගබඩා සහතිකයක් වවුචරයට අමුණා නොමැතිව අවස්ථා 04 කදී රු.437,175 ක් වටිනා භාණ්ඩ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන වලින් මිලදීගෙන තිබුණි.

(iv) දිවි නැගුම වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කර තිබු මිලදී ගැනීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| මිලදී ගැනීම් වර්ගය | ප්‍රමාණය | වටිනාකම රු. | විගණන නිරීක්ෂණ |
|---|---|---|---|
| මීමැසි පෙට්ටි | 580 | 580,000 | ප්‍රසම්පාදන කමිටු නිර්දේශ හා අනුමැතිය නොතිබීම. මු.රෙ.237 ප්‍රකාර කටයුතු නොකිරීම. මුදල් ලැබූ බවට කුවිතාන්සි නොමැතිවීම. බෙදා හැරීම් සම්බන්ධ ලේඛන නොමැති වීම. |
| උපකරණ | 81 | 451,415 | |
| මුං බීජ (ප්‍රමාණය සඳහන් නොවූ) | | 227,520 | |
| මුං බීජ (කි.ග්‍රෑ) | 265 | 86,860 | |
| බඩ ඉරිඟු (කි.ග්‍රෑ) | 170 | | |
| තිබ්බටු පැල | 200 | 54,000 | |
| කැමරා | 1 | 38,500 | |
| පොල් පැල | 10650 | | මු.රෙ.237 ප්‍රකාර කටයුතු නොකිරීම. බෙදා හැරීම් සම්බන්ධ ලේඛන නොමැති වීම. |
| ගෙවතු කට්ටල | 13350 | | |
| කැසට් යන්ත්‍ර | 1 | 2,800 | ප්‍රාදේශීය ලේකම් නිල නිවාසයේ පැවතීම |
| ඉන්ටර්නෙට් ඩොන්ගල් | 1 | 2,100 | සැපයුම් විසන්ධි කර තිබීම |
| මොබිටෙල් සිම්පත | 1 | 2,158 | |
| ළමා උද්‍යාන කට්ටල | 5 | 103,950 | මෙරිගෝ රවුන්ඩ් ක්‍රීඩා උපාංග, ළමා සායනයේ හා කාර්යාල පරිශ්‍රයේ නොතිබීම හා රු.78,750 ක ඉතිරි උපකරණ බෙදා දීමකින් තොරව කාර්යාල භූමියේ තිබීම. |
| ඩෙස් පුටු | 12 | 27,150 | බෙදා නොහැර කාර්යාල භූමියේ තිබීම. |

(v) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් වලට එළඹි කර්මාන්ත පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| කර්මාන්තය | ගිවිසුම්ගත මුදල | අත්තිකාරම් මුදල | නිරීක්ෂණ |
|---|---|---|---|
| | රු. | රු. | |
| පිටවෙල මහගම මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 980,000 | 196,000 | 2012 මැයි 12 දින අත්තිකාරම් මුදල් ලබාදී තිබූ අතර, කර්මාන්තය 2012 ජූලි 27 දින වනවිට අවසන් කලයුතු වුවද, 2012 සැප්තැම්බර් 19 භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටත්, මාර්ගය ආරම්භයේ පැති බැම්ම සඳහා අත්තිවාරම පමණක් දමා තිබුණු අතර, ඒ සඳහා කාලය දීර්ඝ කිරීමක් ද සිදුකර නොතිබුණි. |
| පල්ලේගලදෙනිය පාර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 980,000 | - | (I) අඩි 166 ක් හා 198 ක් දුර පිහිටි ස්ථාන 2 ක මැද කොටස කඩා බැලීමේදී කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියෙන් නොතිබුණි.<br>(II) වැඩ විෂය අංක 3 හි පරිදි පොලිතින් වර්ග අඩි 54.56 ක් එලීමට ඇස්තමේන්තු කර තිබුණද, වර්ග අඩි 39.36 කට පමණක් එලා තිබුණි.<br>(III) වැඩ විෂය අංක 8 පරිදි රු.6,000 ක් ගෙවා තිබුණද, නාම පුවරුව සවිකර නොතිබුණි. |

(ආ) ආදායම් ගිණුම්

ඇස්තමේන්තුගත හා තථ්‍ය අදායම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේතාංක 08 ක් සඳහා රු.17,796,481 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.27,930,603 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 157 ක ආදායමක් වී තිබුණි. ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 104 සිට සියයට 63504 ක් දක්වා පරාසයක ප්‍රතිශතයන්ගෙන් ආදායම රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | (අඩුවෙන් එකතු කිරීම)/ වැඩියෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 1003.07.99 | 5,545,000 | 7,055,012 | 1,510,012 | 127 |
| 20.02.01.01 | 1,108,000 | 1,306,788 | 198,788 | 118 |
| 20.02.002.99 | 5,714,182 | 6,350,703 | 636,521 | 111 |
| 20.03.02.99 | 613,000 | 904,660 | 291,660 | 148 |

| | | | | |
|---|---|---|---|---|
| 20.03.03.00 | 345,000 | 1,295,344 | 950,344 | 375 |
| 20.03.99.00 | 4,255,000 | 4,421,605 | 166,605 | 104 |
| 20.06.02.00 | 10,000 | 6,350,430 | 6,340,430 | 63504 |
| 1003.07.05 | 206,300 | 246,060 | 39,760 | 119 |

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 27901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 50,000,000 | 25,050,444 | 30,000,000 | 33,385,601 | 170,000,000 | 130,589,609 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වසර කිහිපයකට පෙර මිය ගිය හා විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.82,992 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි.

(ii) වසර ගණනාවක සිට සේවය හැර ගොස් ඇති හා සේවයෙන් ඉවත්කළ නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.65,643 ක් වූ ණය ශේෂ අදාල පාර්ශවයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(iii) වෙනත් ණයගැතියන් යටතේ 1999 සිට පැවැත එන සමෘද්ධි නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.9,500 ක හිඟ ණය ශේෂය අදාල පාර්ශවයන්ගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැර ණය ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(iv) ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 4 දෙනෙකුගේ එකතුව රු.410,181 ක් වූ ණය ශේෂ හා 1993 වර්ෂයේ සිට 2001 දෙසැම්බර් 31 දින දක්වා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ස්ථාන මාරුවී ගොස් තිබු නිලධාරීන් 13 දෙනෙකුට අදාලව රු.330,608 ක ණය ශේෂ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිරවුල් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, නිරවුල් කර නොතිබුණි.

(v) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ යෙදී සිටි නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.96,534 ක් වූ ණය ශේෂයක් වැඩිපුර අයකර ගෙන තිබුණි. එය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කේවළ ශේෂ වර්ගීකරණ සාරාංශයේ වැඩිපුර අයවීම් යටතේ දක්වා නොතිබුණි.

(vi) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 විසින් ඉහත කී අත්තිකාරම් ගිණුමේ විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් සඳහා මුදල් රෙගුලාසි 503(1) හා මුදල් රෙගුලාසි 503(1)(e) යටතේ සිදුකළ හර/බැර සීමාවන්ට අදාල නොවූ රු.6,076,440 හර කිරීම් සහ රු.5,603,485 ක බැර කිරීම් වලට අදාල විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එහි නිරවද්‍යතාවය තහවුරු නොවීය.

(ඇ) අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු. 35,567,072 ක් වූ හර ශේෂ තිබුණු අතර, 2012 ජුලි 23 දින සිට පැවත එමින් තිබූ එම ශේෂය 2013 අප්‍රේල් 30 දින වන විටත්, පියවා නොතිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම

දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විහාරස්ථානයක වැඩ සිට අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේ නමකට අයත් බැංකු පොත් හා ස්ථාවර තැන්පත් සහතික බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්ට ද, ලියකියවිලි හා වෙනත් බඩු බාහිරාදිය විහාරස්ථානයේ දායක සභාව වෙතද භාරදී තිබුණද, එම හිමියන් සතුව පැවැති රු.79,198 ක මුදල් පිළිබඳ ගතයුතු තීරණයක් නොගෙන පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2012 මාර්තු 29 දින දීය.

1.7 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|
| ත්‍රීරෝද රථ | 01 | - |

1.8 අනුකූල නොවීම්

නීතිරීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) ආයතන සංග්‍රහය<br>XIX වැනි පරිච්ඡේදයේ 5.4.1 හා 5.7 උප වගන්ති | - | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි තනතුරට හිමි නිල නිවාසය සඳහා 2012 අගෝස්තු 01 දින සිට විගණිත දිනය වූ 2013 ජනවාරි 30 දින දක්වා ගණකාධිකාරි සහ ඔහුගේ කලත්‍රයාගෙන් නිවාස කුලී අයකළ යුතු වුවත්, විගණිත දිනය දක්වාම එසේ අයකර නොතිබුණි. |
| XIX වැනි පරිච්ඡේදයේ 6:2 උප වගන්තිය | - | කෑගල්ල නාගොල්ල පාරේ පිහිටි අංක 40 දරන රජයේ නිල නිවාසය, බාහිර පාර්ශවයකට ලබාදී තිබුණි. මේ පිළිබඳව පසුගිය විගණන විමසුම් වලින් පෙන්වා දී තිබු අතර, 2013 පෙබරවාරි දක්වාම එම නිල නිවාසය නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාරදී නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි<br>මු.රෙ.264 | 198,847 | සෑම ගෙවීමකම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු වියයුතු වුවත්, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.198,847 ක් වූ ගෙවීම් වවුචර් 2 ක් වෙනුවෙන් අදාල කුවිතාන්සි වවුචර් වලට අමුණා නොතිබුණි. |
| මු.රෙ.385 | 27,529 | රු.500 හෝ ඊට වැඩි මුදලක් ගෙවීමේදී චෙක්පතකින් ගෙවීම් කළයුතු වුවත්, ඊට පටහැනිව අංක 8/83 දරන වවුචරය මගින් ප්‍රාදේශීය ලේකම් නිල රථය සේවා කිරීම සඳහා රු.27,529 ක් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් විසින් පෞද්ගලික මුදලින් වැයකර පසුව ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. |
| මු.රෙ.1641 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත්, භාවිතයේ පවතින වාහන 13 ක් සම්බන්ධයෙන් වාහන පිටත්වන වේලාව හා පැමිණෙන වේලාව දක්වමින් ආරක්ෂක අංශ විසින් ගේට්ටු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| මු.රෙ.1646 | - | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විධිමත් පරිදි විගණනය වෙත එවා නොතිබුණි. ඉන් කොටසක් වර්ෂයකට වැඩි කාලයක සිටම ඉදිරිපත් කර නොතිබුණි. වාහන භාවිතා කළ නිලධාරීන්ගේ අත්සන් නොමැති වීම හා මීටරයෙහි අවසානය හා ආරම්භක ධාවන දුර ප්‍රමාණයන්ගේ නොගැලපීමද නිරීක්ෂණය විය. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>අංක 14/2008 හා 2008 ජුනි 26 දිනැති චක්‍රලේඛය | - | මාසික ප්‍රවාහන දීමනාවක් ලබා ගන්නා නිලධාරීන්ට රජයේ වාහනයක් පාවිච්චි කිරීමට කිසිදු හිමිකමක් නැති බව දක්වා ඇතත්, ප්‍රවාහන දිමනා ලබාගත් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි සමාලෝචිත වර්ෂය තුල කි.මී.747 ක් ගමන් කිරීමට රජයේ සංචිත වාහන භාවිතා කර තිබුණි. |

1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) ගැවිලිපිටිය හන්දියේ සිට පරපිටිය දක්වා ජලනල එළීමට 2012 සැප්තැම්බර් 17 දිනැති අරණායක ප්‍රාදේශීය ලේකම් හා සමඟි ගොවි සංවිධානය අතර, කර්මාන්තය ඉටු කිරීම සඳහා ඇති කරගත් ගිවිසුම අනුව මාස 01 ක් තුළ කර්මාන්තයේ වැඩ අවසන් කළයුතු වුවත්, විගණිත දිනය වූ 2012 නොවැම්බර් 28 දින වන විටත්, එහි වැඩ අවසන් කර නොතිබුණු අතර, ඒ සඳහා කාලය දීර්ඝ කිරීමට හෝ ඉල්ලීමක්ද කර නොතිබුණි.

(ii) විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ හෙට්ටිමුල්ල නව කනිෂ්ඨ විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාල රු.382,188 ක් වූ පළමු කොටසේ ගෙවීම් වාර්තාවේ විෂය අංක 12 අනුව ලින්ටල් ඉදිකිරීම සඳහා රු.13,374 ගෙවා තිබුණද, විගණිත දිනය වූ 2013 ජනවාරි 18 දින වන විටත්, එය ඉටුකර නොතිබුණු අතර, ගෙවීම් වාර්තාවේ විෂය අංක 09 අනුව කණු 12 ක් කොන්ක්‍රීට් කිරීම සඳහා රු.28,162 ක් ගෙවා තිබුණද, විගණන අවස්ථාව වන විට ඉදිකර තිබුණේ කොන්ක්‍රීට් කණු 09 ක් පමණක් නිසා කොන්ක්‍රීට් කණු 03 ක් වෙනුවෙන් රු.7,040 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වර්ග අඩි 11,412 ක් වූ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් නව කාර්යාල ගොඩනැගිල්ල රු.294,982,342 ක මුදලකට ඉදි කිරීමට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබූ අතර, 2013 ජුනි 13 දින වන විට කර්මාන්තය වෙනුවෙන් රු.92,126,334 ක් වැයකර තිබුණි. එහි වැඩ 2013 මැයි 10 දින වන විට අවසන් කළයුතු වුවත්, පිළිගත හැකි සාධාරණ හේතු නොමැතිව ගිවිසුමේ වලංගු කාලය 2013 නොවැම්බර් 10 දින දක්වා මාස 06 කින් දීර්ඝ කර තිබුණි. ඊට සමගාමීව රු.13,397,867 ක් වූ කාර්ය සාධන ඇපකරයේ හා රු.272,957,342 ක් වූ සියළු අවදානම් රක්ෂණයේ වලංගු කාලය 2014 නොවැම්බර් 10 දක්වා දීර්ඝ කර නොතිබුණි. 2013 ජුනි 13 විගණිත දින වන විටත්, රු.26,000,097 ක් වූ 8.8% ක පමණ ඉදි කිරීම් නිම කර තිබූ අතර, ඉතිරි වැඩ කොටස් 2013 නොවැම්බර් 10 දින වන විට නිම කිරීමට ඉලක්ක ගත දින සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ii) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ අඩි පාලම් 3 ක කොටස් ඉදිකිරීම සඳහා රු.484,856 ක් අනුමත වී තිබුණද, එම පාලම් සම්පූර්ණයෙන්ම නිම නොවීම නිසා වැය කළ මුදල අනාර්ථිකව පැවතුණි.

(iii) 2012 විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ 2012 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල මිලදීගෙන තිබූ රු.282,550 ක් වටිනා භාණ්ඩ 2013 පෙබරවාරි දක්වාම ප්‍රතිලාභීන්ට ලබා නොදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(ඈ) භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම.

මු.රෙ.137(5), 138(4) හා 237(ආ) ප්‍රකාර ගෙවීම් වවුචර් අනුමත කිරීම, සහතික කිරීමට පෙර ගබඩා සැපයුම් ලැබී ඇති බවටද, අදාල බඩු හා තොග පොතෙහි ඇතුළත් කර ඇති බවටද සහතිකයක් ඇමිණිය යුතු වුවත්, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගබඩා ද්‍රව්‍ය මිළදී ගැනීමට 2012 දෙසැම්බර් 31 දින රු.108,303 ක් වටිනා වවුචර් සකස් කර අනුමත/ සහතික කර චෙක්පත් ලියා ඇතත්, 2013 ජනවාරි 18 විගණන දින වන විටත්, අදාල භාණ්ඩ ගබඩාවට ලබාගෙන නොතිබුණි.

(ඇ) වෙනත් දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පහත සඳහන් කර්මාන්ත සඳහා අත්තිකාරම් ලබාදී ගිවිසුම් කාලය අවසන් වී ඇතත්, විගණිත දිනය වූ 2012 ඔක්තෝබර් 04 දින තෙක් වැඩ ආරම්භ කර හෝ නොතිබුණි.

| කර්මාන්තය | ගිවිසුම් මුදල | ලබාදුන් අත්තිකාරම | අත්තිකාරම් ලබාදුන් දිනය | ගිවිසුම් දිනය | අවසන් කළයුතු දිනය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| ඉංගිරියාවත්ත කොළණි මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 962,636 | 192,500 | 2012.09.28 | 2012.09.24 | 2012.09.30 |
| බටහේන්කන්ද පහල වටවල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 960,035 | 192,000 | 2012.07.05 | 2012.06.25 | 2012.09.25 |

(ii) ශ්‍රී ජයවර්ධනාරාමය, බැම්ණිවත්ත, මාවනැල්ල ජලනල දිර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රු.979,210 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර, එම ඇස්තමේන්තුව තුල ජලනල එලීම සඳහා කානු කැපීම සහ නැවත වැසීමට ශ්‍රම දායකත්වය යටතේ රු.113,750 ක් ඇතුළත් කර එම කාර්ය ශ්‍රමදායකත්වය තුලින් ඉටුකර තිබුණද, එයට අදාල මුළු මුදලම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවා තිබීම හේතුවෙන් රු.113,750 ක නොකල වැඩ සඳහා ගෙවීම් කර තිබුණි.

(iii) දිවිනැගුම වැඩ සටහන යටතේ පළතුරු පැල මිලදී ගැනීමට 2012 ජුනි 05 දින ප්‍රසම්පාදන කමිටුවට තීරණය කළ ප්‍රමාණය ඉක්මවා රු.925,535 ක් වටිනා පළතුරු පැල 6038 ක් මිලදීගෙන තිබුණි. තවද තෝරාගත් එක් පැල තවානකින් පළතුරු පැල මිලදීගත් මිල ගණන් වලට වඩා අඩු මිල ගණන් යටතේ ඊට පසු අවස්ථාවක වෙනත් වැඩ සටහනක් සඳහා පළතුරු පැල මිලදීගෙන තිබූ අතර, එම මිල ගණන් සංසන්ධනය අනුව දිවි නැගුම වැඩ සටහන සඳහා සැපයූ පළතුරු පැල සඳහා රු.208,340 ක් වැඩිපුර අයකර තිබුණි. මිලදීගත් පළතුරු පැල වලින් රු.27,820 ක් වටිනා පළතුරු පැල විගණන පරීක්ෂණ දිනය වූ 2013 ජනවාරි 18 දින වන විටත් ප්‍රතිලාභීන්ට බෙදා හැර නොතිබූ අතර, එම පැල භෞතිකව පරීක්ෂාව සඳහා ද ඉදිරිපත් නොකෙරුණි.

1.10 කාර්ය සාධනය

ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

හදිසි ආපදා තත්ත්වයකදී ජනතාවට සහන සැලසීම හා ආපදාවලට ලක්වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ එක් අරමුණක් වුවද, 2011 මැයි සිට 2012 මාර්තු දක්වා කාලය තුල ගං වතුර, සුළි සුළං හා අකුණු වැනි ආපදා තත්ත්වයෙන් හානියට පත් නිවාස 61 ක් පුනරුත්තාපනය කිරීම සඳහා අනුමත කර තිබුණු රු.1,546,000 ක මුදල සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට විගණිත දින වූ 2012 නොවැම්බර් 15 දින දක්වාත් කටයුතු කර නොතිබුණි.

1.11 අවිධිමත් ගනුදෙනු

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව රු.30,340 ක් වැයකර ලිපිකරු පුටු 8 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දිවි නැගුම වැඩ සටහන යටතේ ප්‍රතිලාභීන් අතර, බෙදා දීමට අවශ්‍ය පළතුරු පැල හඳබිම අධිකාරියෙන් මිලදී නොගෙන වෙනත් පුද්ගලික පැල තවානකින් මිලදී ගැනීම නිසා රු.811,350 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) ප්‍රවාහන ගාස්තු හා කම්කරු කුලී සඳහා අදාල සේවා සැපයුම්කරු වෙත චෙක්පතකින් ගෙවීමේ හැකියාව තිබියදී මුදල් රෙගුලාසි වලට පටහැනිව පොල්, ගම්මිරිස් හා පළතුරු පැල ග්‍රාම නිලධාරි වසම්වලට ප්‍රවාහනය කර බෙදා හැරීම වෙනුවෙන් වරකාපොල ප්රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) විසින් සිය පෞද්ගලික මුදලින් රු.110,100 ක් ප්‍රවාහන හා කම්කරු කුලී ලෙස වියදම් දරා පසුව ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි .

(ඈ) වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ ලබාදී තිබූ චක්‍රීය අරමුදල් ක්‍රියාත්මක වීම පිළිබඳ 2012 ඔක්තෝබර් 31 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී වද්දෙනිය සමෘද්ධි බැංකුව විසින් ප්‍රතිලාභීන් 22 නෙකු වෙත වාරික 10 කින් අයවීම පිණිස 2012 වර්ෂයේදී ලබාදී තිබූ රු.201,837 ක චක්‍රීය අරමුදල් වලින් එකතුව රු.188,237 ක් වූ මුදලක් අයවීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය.

1.12 පාඩු හා හානි

විගණන දිනය වූ 2012 ඔක්තෝබර් 30 දින වන විටත්, රක්ෂණයෙන් අනාවරණය වී නොතිබුණු රු.110,050 ක අලාභයක් රියදුරු ගෙන් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.13 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගල්පාත එගොඩමුල්ල ප්‍රජා ශාලාව අසල පැති බැම්ම ඉදි කිරීම හා පස් පිරවීම සඳහා 2011 දෙසැම්බර් 28 දින රු.106,310 ක් ගෙවා තිබූ නමුත්, විගණිත දින වූ 2012 ඔක්තෝබර් 03 දින වන විටත්,එකී ඉඩමේ අයිතිය රජයට පවරාගෙන නොතිබුණි.

(ආ) කර්මාන්ත ලිපිගොනු පරීක්ෂාවේදී පිළිවෙලින් 2011 නොවැම්බර් 30 හා 2012 සැප්තැම්බර් 30 දිනයන්හිදී වැඩ නිම කළයුතු වූ ගිවිසුම් වටිනාකම පිළිවෙලින් රු.195,084 ක් හා රු.962,636 ක් වූ අමනාවල මාහංගල මාර්ගය හා ඉංගිරියාවත්ත කොළණි මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අදාල ගිවිසුම් අත්සන් කර තිබුණේ පිළිවෙලින් 2011 නොවැම්බර් 21 හා 2012 සැප්තැම්බර් 24 යන දිනයන්හිදී බැවින් එම කර්මාන්ත ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 1935 වර්ෂයේ දී සේවක නිල නිවාස ඉදිකිරීම සඳහා රජයට අත්පත් කර ගෙන ඇති කෑගල්ල නාගොල්ල පාරේ පිහිටි අක්කර 06 රූඩ් 03 පර්චස් 01 ක ඉඩමෙහි 1957 වර්ෂයේ සිට අනවසර පදිංචිකරුවන් හා බලපත්‍රලාභි පවුල් 15 ක් පමණ ස්ථිර නිවාස ඉදිකරගෙන භූමිය තුල පදිංචි වී සිටින අතර, 2012 අගෝස්තු දක්වාම ඉහත ඉඩමෙන් අනවසර පදිංචිකරුවන් හා බලපත්‍රලාභීන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.14 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (I) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 37 | 04 |
| (II) | තෘතියික මට්ටම | 30 | 21 | 09 |
| (III) | ද්විතීයික මට්ටම | 920 | 743 | 177 |
| (IV) | ප්‍රාථමික මට්ටම | 106 | 95 | 11 |
| | එකතුව | 1097 | 896 | 201 |

(ආ) බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල නොවීම

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HAF – 3 – ADMIN – CMA - 015 හා 2011 අගෝස්තු 12 දිනැති ලිපිය මඟින් 2010 සැප්තැම්බර් 29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ පරීක්ෂණයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් විසින් වැඩ බැලීමේ පත්වීම් 24 ක් ලබාදී තිබූ අතර, ඒ සඳහා 2006 වර්ෂයේ සිට 2011 විගණිත දිනය දක්වා දීමනා වශයෙන් රු.1,406,828 ක් ගෙවා තිබුණි.